පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 79

ආයතනයේ නම : රාජ්‍ය පරිපාලන . පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 79

ආයතනයේ නම - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය ගෙන ඇති පියවර/වත්මන් තත්වය
පළමු කොටස	
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පළමු දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු, දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කිරීමට පියවර ගන්නා ලදි.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සංචිත වාහනවල දෛනික සටහන් අභ්‍යන්තර විගණනය සඳහා යොමු කර ඇති අතර විගණකාධිපති වෙත යොමුකිරීම සඳහා මේ වනවිට ධාවන සටහන් ඉදිරිපත් කර ඇත.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	අමාත්‍යාංශය සතු වාහන කීපයක රාජ්‍ය ලාංඡන පින්තාරු කර නොමැති අතර මේ වන විට එම වාහනවල රාජ්‍ය ලාංඡන පින්තාරු කිරීම සඳහා කටයුතු සූදානම් කරමින් පවතී.
ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදුව තිබුණි.	2022 වර්ෂයේදී කාර්තු පදනම මත ප්‍රතිපාදන වෙන්කල අතර 2022 ඔක්තෝම්බර් මාසයේදී ස්වදේශ කටයුතු අංශය 409 වැය ශීර්ෂයේ සිට 130 වැය ශීර්ෂය වෙත 2022.10.01 දින මාරු කරන ලදී. ඒ අනුව 2021 අංක 30 දරන විසර්ජන පනතට අදාල වැය ශීර්ෂය හා වැය විෂයන් යටතේ 2022.01.01 සිට 2022.09.30 දක්වා 409 ශීර්ෂය යටතේ දරන ලද වියදම් 130 නව වැය ශීර්ෂය වෙත මාරු කරන ලදි. එහිදී 2022 ඔක්තොම්බර් මාසයේදී ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දරා ඇති බව භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් තුලින් පෙන්නුවද එය 2022 වර්ෂයේ අවසාන කාර්තුව තුලදී නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2024 .05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 හි 04 අන්තර් කාලීන විධි විධාන ප්‍රකාරව නීතිමය කටයුතු ආරම්භ නොකරන ලද ණය ශේෂ හැර ප්‍රධාන ගණුන්දීමේ නිලධාරියාගේ සීමාව තුළ වන තවදුරටත් අයකර ගත නොහැකි ලෙස හඳුනාගන්නා ලද ණය ශේෂ, ප්‍රධාන ගණුන්දීමේ නිලධාරියා හරහා අනුමැතිය ගෙන අතහැර දැමීමටත් අදාල සීමාව ඉක්මවන ලද ණය ශේෂ අතහැර දැමීම සඳහා භාණ්ඩාගාරයට යොමු කිරීමටත් කටයුතු සලසන ලද අතර අනෙකුත් ණය ශේෂ මේ වන විට අය කරමින් පවතී. එමෙන්ම නීතිමය කටයුතු ආරම්භ කරන ලද ණය සම්බන්ධයෙන් එම උපදෙස් අනුව කටයුතු කරමින් පවතී. **<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාල</u>** හිඟ හිටි ණය ශේෂ ලෙස බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රු.13,891.50 ක ණය ශේෂය නිලධාරීන් හතර දෙනෙකුට අදාළව වන අතර එම නිලධාරීන් 2015 වර්ෂයේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර පසුව යටිතල පහසුකම් හා සංවර්ධන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන ලද නිලධාරීන්ගේ ණය වාරික අය කිරීම 104011 ශීර්ෂයට බැර කර

	ඇති අතර පසුව ඉතිරිව පැවති ණය ශේෂය පමණක් පදනම් කරගෙන ණය ශේෂ නිරවුල් කිරීම නිසා මෙම ගැටළුව ඇති වී ඇති බව දන්වා ඇති අතර අදාළ නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බවද කාරුණිකව දන්වා සිටිමි. එසේම රු 17,500ක ණය ශේෂයක් නිලධාරීන් දෙදෙනෙකුට අදාළ වන අතර එම නිලධාරීන් දෙදෙනා 2015 වර්ෂයේ දී ස්ථාන මාරු වී ඇති අතර 2016 වර්ෂයේ ණය ශේෂ නිරවුල් කරන අවස්ථාවේදී අමාත්‍යාංශ වැය ශීර්ෂ මාරු වීම නිසා බැර කළ යුතු වැය ශීර්ෂය ගැටළුකාරී වී ඇති අතර පසුව කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රු6250.00 බැගින් රු 12,500 ක් අයකර රාජ්‍ය අදායමට බැර කර ඇති අතර නැවත එම වාරික රාජ්‍ය ආදායමෙන් අයකර නිරවුල් කරන බවට දන්වා ඇති බව කාරුණිකව දන්වමි. තවද රු 403,582 ක ණය ශේෂයක් නිලධාරීන් හතර දෙනෙකුට අදාළ වන අතර එම ණය ශේෂ නිරවුල් කිරීම නුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සිදු විය යුතු අතර එම නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දන්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ රු 94,684.00 ක ණය ශේෂය 2015 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන ලද නිලධාරීන්ගේ ණය ශේෂ වේ. එවකට අමාත්‍යාංශ මාරු වීම හේතුවෙන් සියලු නිලධාරීන් කඳුරට නව ගම්මාන යටතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත. එහිදී කඳුරට නව ගම්මාන යටතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය හා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අතර ණය ශේෂ පියවීමේදී සිදු වූ වරදකින් ණය ශේෂ අතර වෙනස ඇති වී තිබෙන බව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. එසේම වර්තමානයේ ජල සම්පාදන සහ වතු යටතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ වතු යටතල පහසුකම් සංවර්ධන අංශය යටතේ දැනට සේවය කරන නිලධාරීන්ගෙන් හා ස්ථාන මාරු වී ගොස් ඇති නිලධාරීන්ගේ නව සේවා ස්ථානයන් හා සම්බන්ධ වී කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන මෙන් රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙත උපදෙස් ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රු 158, 420 ක් හා 79.700 ක ණය ශේෂ දෙකක් වන අතර ඉන් ඉන් රු 158,420 ක ශේෂයෙන් රු 13,000 ක ශේෂයන් අයකරගෙන ඇති අතර ඉතිරි ශේෂය අය කර ගැනීම සඳහා පොලිස් පැමිණිල්ලක් යොමු කර ඇති බව දන්වා එවා ඇත. එසේම රු 79,700 ක ණය ශේෂ අදාළ නිලධාරියා විදේශ ගත වී ඇති අතර අවශ්‍ය අදාළ තොරතුරු විමසා ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇති බවට දන්වා එවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
දෙවන කොටස	
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරමින් පවතී.

ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යවර්ත මට්ටමේ හෝ අනිතකර මට්ටමේ විය.	අමාත්‍යාංශයේ විගණන මතය තත්වාගණන මතයකි. ආදායම් ගිණුම් සම්බන්ධයෙන් ආදායම් ගණන් දීමේ නිලධාරියා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු ,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වන අතර අනිකුත් ආයතන වලින් (ආයුර්වේද දෙපාර්තමේන්තුව) ආදායම් ගිණුමට සිදුකරනු ලබන මූල්‍ය ගනුදෙනු වල පවතින අඩුපාඩු නිසා අමාත්‍යාංශයේ විගණන මතය තත්වාගණනය කර ඇති බැව් දන්වා සිටිමි.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	2024 වර්ෂය වන විට මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	සියලුම නිලධාරීන් හට වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙසට දැනුවත් කර ඇති අතර ඒ පිළිබඳ නිරන්තර පසු විපරම් සිදු කරනු ලබයි.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	2022 වර්ෂය වන විට රටෙහි පැන නැඟී තිබූ ආර්ථික අර්බුද හමුවේ වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් නොකළ නිලධරයන් වෙත ස්ථාන මාරුවීම් ලබා නොදුන් අතර ඉල්ලුම් කළ නිලධරයන් සඳහා හැකිතාක් දුරට මාරු කිරීම් සඳහා වන කරුණු බොහෝමයක් සලකා බලා ඒවා ගළපමින් මාරුවීම් ලබාදීමට කටයුතු කරන ලදී. තවද බොහෝ සේවා ස්ථාන කොළඹ කේන්ද්‍රීයව පැවතීම, වත්මන් ආර්ථික අර්බුද හමුවේ නිලධාරියන් පදිංචි ප්‍රදේශ ආසන්නයේ සේවා ස්ථාන හෝ ප්‍රියමනාප සේවා ස්ථාන ඉල්ලුම් කිරීම හා වසර පහ සම්පූර්ණ කළ ද ඇතැම් ආයතන වලට පැමිණීමට කිසිදු නිලධාරියෙකු එකඟතාවේ පල නොකිරීම යන හේතු මත ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම අපහසු වී ඇත. එහෙත් හැකිතාක් දුරට ඉහත සියලු කරුණු සලකා බලමින් වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති හා වසර පහක සේවා කාලය සම්පූර්ණ කර නිලධරයන් වෙත ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර ඇත. තවද 2025 වර්ෂික ස්ථාන මාරු ලබාදීමේදී ද එලෙස කටයුතු කිරීමට අවශ්‍ය පියවර මේ වන විට සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 79

ආයතනයේ නම: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 79

දෙපාර්තමේන්තුව- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

පළමු කොටස

	රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මඟපෙන්වීම්	වර්තමාන ප්‍රගතිය (2022 මුදල් වර්ෂය)
1	පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
2	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	විගණන සැලැස්ම සකස් කිරීමට පාදක කර ගැනීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු වක්‍රලේඛ ප්‍රකාර අවදානම් ලේඛනයක් අභ්‍යන්තර විගණන අංශය විසින් 2022/2023 වර්ෂයන්ට අදාළව යාවත්කාලීන කර ඇත.
3	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	හැකිතාක් දුරට ප්‍රමාදයකින් තොරව පිළිතුරු ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.
4	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා නියමිත දිනයට පිළිතුරු යැවීමට කටයුතු කරමින් පවතී.
5	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ වක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	යාවත්කාලීනව තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ.
6	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශය ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාලවකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි	නියමිත කාලය තුළ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
7	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	මේ වන විට එම කටයුතු අවසන් කර ඇත.
8	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වාගෙන යමින් පවතී.
9	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු සිදු කෙරෙමින් පවතී.

10	මු.රෙ. 94(1) ප්‍රකාරය වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි.	භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා නොදීම හේතුවෙන් මෙම තත්වය ඇති වී තිබේ.
11	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අයකර ගත හැකි ණය ශේෂ තවදුරටත් අයකරමින් පවතින අතර, සම්පූර්ණ අයකර ගැනීම් ද සිදුකර ඇත. තවදුරටත් අයකර ගැනීමට නොහැකි ණය ශේෂ 2024.05.29 දිනැති රා.මු.වක්‍රලේඛ 01/2024 ට අනුව කපා හැරීමට විධිමත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන අතර, වර්ෂය අවසන් වීමට ප්‍රථම සියළු පියවර ගැනීමට කටයුතු කිරීම.
12	පොදු තැන්පත් ගිණුමේ කල්ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල්ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇත.
13	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට අදාළ කාර්යය නිමවී මසක් ඇතුලත නිරවුල් කරගැනීමට පියවර ගැනීම.
14	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බදවා ගෙන තිබුණි.	රාජ්‍ය සේවයට බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් කොටසක් මෙම දෙපාර්තමේන්තුව වෙතද අනුයුක්ත කල අතර එම නිලධාරීන් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් සිදු කර ඇත.

දෙවනි කොටස

1	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබානොදීම සම්බන්ධව ඉදිරිපත්වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනුලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	අදාල ලේඛනය පවත්වා ගෙන යනු ලබයි.

2	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වෙබ් අඩවිය මගින් මහජනයාට විමසීම්, පැමිණිලි, යෝජනා සහ ප්‍රශංසා සටහන් කිරීම සඳහා සුදුසු තාක්ෂණික ක්‍රියාමාර්ග වෙබ් අඩවියට ඇතුලත් කර ඇත. ඒ අනුව මහජන විමසීම්, පැමිණිලි හා යෝජනා යොමු කිරීම සඳහා යොමුවක් (Inquire, Complaints & Suggestions form) ඇති අතර, එමගින් විද්‍යුත් තැපෑලය වෙත මහජන යොමු කිරීම් ලැබේ. භාෂා ත්‍රිත්වයෙන්ම මෙම පහසුකම සලසා ඇත.
3	ආයතනයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	කටයුතු සිදු කෙරෙමින් පවතී.
4	සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	කටයුතු සිදු කෙරෙමින් පවතී.
5	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය හිතකර මට්ටමට ලභාකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.
6	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි	වත්කම් බැරකම් ලේඛන ලබාදී ඇති නිලධාරීන් සහ ලබා දී නොමැති නිලධාරීන්ගේ ලේඛනය අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත 2024.07.19 දිනැතිව යොමුකර ඇත.

එස්. ආලෝකබණ්ඩාර

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

ආයතනයේ නම : බහු කාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 79

ආයතනයේ නම - බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව

	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය ගෙන ඇති පියවර/වත්මන් තත්වය
පළමු කොටස		
01	සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ස්ථාවර වත්කම් මොඩියුලය දෙපාර්තමේන්තුවේ විසින් මිලදී ගත් ස්ථාවර වත්කම් නිසිපරිදි යාවත්කාලීන කොට පැවතුණු අතර, වෙනත් දෙපාර්තමේන්තු වලින් ලද වත්කම් පමණක් යාවත්කාලීන කොට නොතිබුණි. 2024/06/05 දින දෙපාර්තමේන්තුව ඇවර කිරීමේ දී දෙපාර්තමේන්තුව සතුව පැවති සියළුම ස්ථාවර වත්කම් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට පවරා දී ඇත.
02	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමු ඇතුලත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳ වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද, නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත්කර අදාල වර්ෂයේ දෙසැම්බර් 31 වන දින භාණ්ඩ සමීක්ෂණ සිදුකර තිබුණද, පළාත් කාර්යාල වල භාණ්ඩ සමීක්ෂණ වාර්තා ප්‍රමාදය මත නියමිත දිනට විගණකාධිපතිට ඉදිරිපත් කිරීමට නොහැකි වූ නමුත්, එම දිනෙන් පසුව වාර්තාව ඉදිරිපත් කර ඇත. කලින් වර්ෂ වලට අදාල භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් ඌනතා හා අතිරික්ත සම්බන්ධව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය මත අදාල කපාහැරීම්, වෙන්දේසි කිරීම් මේ වන විට සිදුකර අවසන් වී ඇත.
03	සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතුව පැවති වාහන දෙකෙහි රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුනු අතර, 2024/06/30 දින දෙපාර්තමේන්තුව ඇවර කිරීමත් සමඟ එම වාහන වෙනත් දෙපාර්තමේන්තු වලට පවරා ඇත. සමාලෝචිත කාල පරිච්ඡේදය තුල වාහන අනතුරු හෝ ගර්හිත වීම් කිසිවක් වාර්තා වී නොතිබුණි
04	මු.රේ. 94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන සීමාවීම නිසා හිඟ දුරකතන හා විදුලිය යන උපයෝගී බිල්පත් වෙනුවෙන් එසේ බැඳීම් වලට එළඹීමට සිදුවිය. ඉන්පසු මු.රේ. 94(1) පරිදි කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.
දෙවන කොටස		
05	මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා දීම/ නොදීම සම්බන්ධව විස්තර ඇතුළත් ලේඛණයක් පවත්වා නොතිබුණි ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛන ගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි. ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු	මෙම දෙපාර්තමේන්තුව 2021 වර්ෂයේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස හා ආරම්භ කරන ලද අතර, බදවා ගන්නා ලද පුහුණු සහයකයින් මාස 06 ක් තුල පුහුණු කර ස්ථිර රාජ්‍ය සේවයට පත්කිරීමට ඉලක්ක ගත වී තිබූ බැවින් ඒ අවස්ථාව වන විට විශාල මුදලක් දරා වෙබ් පිටුවක් නිර්මාණය කිරීම සිදුනොකරන ලදි. වෙබ් අඩවියක් නොමැති වුවද ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා එම අවස්ථාව සලසා දී තිබුණි. ඒ අනුව අදාල කාර්යය සාර්ථකව පවත්වාගෙන ගොස් පුහුණු සහායකයින් මේ වන විට 28000 ක් පමණ ස්ථිර රැකියාගත කොට ඇත.

	ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වාගෙන යන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි	
06	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිලියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතනය නිසි ක්‍රමවේදයත් සකස් කර නොතිබුණි.	සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර තිබුණද එය ප්‍රදර්ශණය කර නොතිබුණි. තවද දෙපාර්තමේන්තුවෙන් බාහිර සේවා ලාභීන්ට සේවය ලබාගැනීමට අවශ්‍යතාවයක් නිර්මාණය වී නොතිබුණු බැවින් ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා නොදුණි. සියලු කටයුතු සම්බන්ධව දෙපාර්තමේන්තු දත්ත පද්ධතියක් පවත්වාගෙන යමින් දිවයිනපුරා සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා පළාත් කාර්යාල සම්බන්ධීකරණයෙන් මෙම කටයුතු අධීක්ෂණය කොට ක්‍රමවත්ව පවත්වාගෙන යන ලදි.
07	2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	විගණන දිනය වන විට මානව සම්පත් සැලැස්ම පිලියෙල කර නොතිබුණු අතර, පසුව සෑම වර්ෂයකටම අදාලව මානව සම්පත් සැලැස්ම අමාත්‍යාංශය වෙත යවන ලදි. දෙපාර්තමේන්තුව ආරම්භයේම විශාල වියදමක් දරා සිළුම නිලධාරීන් සඳහා රන්ටැඹේ ශිෂ්‍යභට පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුවක් ලබාදෙන ලදි. එම නිසා ඊළඟ වර්ෂයේ ලැබී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් සියලුම නිලධාරීන්ට එය ලබා දීමට හැකියාවක් නොතිබුණි.
08	සමස්ථ කාර්ය මණ්ඩලයට අතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	අදාල කාර්ය සාධන ගිවිසුම් සකස්කර නොතිබූ අතර, මේ වන විට දෙපාර්තමේන්තුවේ කටයුතු අවසන් කර ඇත.
09	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ප්‍රමුඛතාවය සහායකයින් සම්බන්ධව ලබාදුන් අතර, මේ පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වා නොමැත. බහුකාර්ය සහයකයින් 100,000 ක් බඳවා ගැනීමට ඉලක්ක ගත වී තිබූ බැවින්, පුහුණු අවස්ථා සඳහා ප්‍රතිපාදන ද 100,000 කට ලැබී ඇත.නමුත් බහුකාර්ය සහයකයින් 38,000 ක් පමණක් බඳවාගත් බැවින් මෙලෙස අනාවරණය වී ඇත.

එස්. ආලෝකබණ්ඩාර

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 79

ආයතනයේ නම රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 79

ආයතනයේ නම - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වත්මන් තත්වය
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මේ වන විට සියළුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලැබී ඇති අතර ඉදිරියේදී නියමිත දිනට පිළිතුරු ලබා දෙන ලෙස දැනුවත් කර ඇත.
සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	අංක WP KR – 6360 දරණ වාහනයේ අයිතිය තහවුරු කිරීමට අදාල සියළුම ලිපි දෙපාර්තමේන්තුවට ලබා ගෙන ඇත.

.....

එස්. ආලෝකබණ්ඩාර

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 79

ආයතනයේ නම: විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

ආයතනයේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

කමිටුව මඟින් හඳුනාගන්නා ලද අඩුපාඩු	එම අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද පියවර / වර්තමාන තත්වය
පළමු කොටස 1.) විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මහක් ඇතුළත පිළිතුරු ලබා නොදීම	විගණකාධිපති වෙතින් ලැබී ඇති විගණන විමසුම් වලින් පෙන්වා දී ඇති අඩුපාඩු දිස්ත්‍රික් ලේකම් කාර්යාල ,ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා සම්බන්ධිත අනෙකුත් රාජ්‍ය ආයතන වෙත දන්වා එම අඩුපාඩු නිවැරදි කිරීමෙන් පසුව පිළිතුරු හා පැහැදිලි කිරීම් ලබාගෙන විගණන විමසුම් සඳහා සම්පූර්ණ වශයෙන් පිලිතුරු ලබා දිය යුතු බැවින්, කාල පමාවක් සිදුවේ. මේ සඳහා පහත හේතූන් බලපායි. i. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නිකුත් කරනු ලබන සෑම විගණන විමසුමක්ම අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන විගණන විමසුම් අදාළ අංශ වෙතද යොමු කර පිළිතුරු ලබා ගෙන සම්පූර්ණ පිළිතුරක් ඉදිරිපත් කිරීමට සිදුවීම. ii. විගණන විමසුම් තුළ සඳහන් කෙටි කලක් තුළදී නිවැරදි කළ හැකි සෑම අඩුපාඩුවක්ම නිවැරදි කිරීමෙන් පසුව එම නිවැරදි කිරීම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛනද සමඟ පිළිතුරු යොමු කරන මෙන් ප්‍රාදේශීය ලේකම් වෙත දන්වන බැවින් එම නිවැරදි කිරීම් සඳහා කාලයක් ගත වීම. iii. විශ්‍රාමිකයන් මිය යාම සහ වෙනත් හේතු නිසා සිදු වන වැඩිපුර ගෙවීම් බැංකු වලින් ගෙන්වා ගැනීමට කටයුතු කර එම විස්තරද විගණන පිළිතුර සඳහා ඇතුළත් කිරීම. iv. විශ්‍රාමිකයන් මිය යාම සහ වෙනත් හේතු නිසා සිදු වන වැඩිපුර ගෙවීම් බැංකු වලින් ගෙන්වා ගැනීමට කටයුතු කර එම විස්තරද විගණන පිළිතුර සඳහා ඇතුළත් කිරීම. v. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවූ පසු එම ලබා දී ඇති පිළිතුරු විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය හා ලිපි ලේඛන සමඟ සංසන්දනය කර නිවැරදි බව තහවුරු කර ගැනීමද ,තවදුරටත් අපැහැදිලි තොරතුරු වෙතොත් දුරකථනයෙන් ,whatsapp, Email හෝ Fax මඟින් නැවත තොරතුරු ලබා ගැනීමෙන් පසුව පිළිතුරු සකස් කිරීම. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාලව නිකුත් කරන ලද විගණන විමසුම් බොහොමයක් සඳහා නිවැරදි කිරීම වලින් පසුව කෙටි කලක් ඇතුළත පිළිතුරු සපයා ඇත. විගණකාධිපතිගේ හා අභ්‍යන්තර විගණකගේ විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

	වලදී සාකච්ඡාවට යොමුවී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නියමිත පරිදි පිළිතුරු ඉදිරිපත් කිරීම සඳහා සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් විසින් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. ඊට අමතරව දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගී වන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් මාර්ගයෙන් දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී මේ පිළිබඳව සාකච්ඡා කිරීමට පියවර ගෙන ඇත.
2.) අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු ලබා නොදීම.	2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන විමසුම් 11 ක් ඉදිරිපත් කර ඇත. එම විමසුම් අතුරින් විමසුම් 9 ක් සඳහා මාස 3 ක් ගත වීමට පෙර පිලිතුරු ලැබී ඇති අතර අනෙකුත් විමසුම් 2 සඳහා පිළිතුරු ලැබීමට මාස 4 ට වඩා කල් ගත වී ඇත. 2023 වර්ෂයේ ජනවාරි මස 03 දින වන විට ඉතිරි විමසුම් සියල්ල සඳහා පිළිතුරු ලැබී ඇත. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කරන මෙන් අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් හා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල අයත් දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කර ඇත.
3.) මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබීම	2022 වර්ෂයේ ලබාගත් අතුරු අග්‍රිම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සේවාවන් පවත්වාගෙන යාම වෙනුවෙන් ඉන්ධන ලබා ගැනීම සඳහා ලබාගත් අතර මෙම කාල සීමාවේදී රටේ පැවති ඉන්ධන හිඟතාවය හා ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ ඉන්ධන සපයා ගැනීමට ආයතන කිහිපයක් සමඟ සම්බන්ධ වෙමින් ඉතා අසීරු ලෙස දීර්ඝ ක්‍රියාදාමයක නිරත වීමට සමහර අවස්ථාවන්හි සිදු විය. එහිදී එම අත්තිකාරම් පියවීම සඳහාද කාල ප්‍රමාදයක් සිදු විය. නමුත් ඉදිරියට ලබාගන්නා සියළු තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය ඉටුකළ සැනින් පියවන ලෙස නිලධාරීන් දැනුවත් කර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකසා ඇති අතර 2023 වර්ෂයේ මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ සියළුම තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර ඇත.
දෙවන කොටස **1). 2018 01/24 දිනැති අංක 02/ 2018 දරන රා. පරි වක්‍රෙල්ඛය අනුව නිසි පරිදි සකස් කරන ලද මානව සම්පත් සැලැස්මක් නොතිබීම.**	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුනද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු සැලැස්ම සකස් කර තිබූ අතර, එවකට රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්වය මත දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුකර ඇත. එමෙන්ම, 2023 වර්ෂයේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය ආයතයන්හි විෂය නිලධාරීන්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්තව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු නිලධාරීන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධ මාර්ගගත පුහුණු වැඩසටහන් 14ක් ඇතුළුව පුහුණු වැඩසටහන් 19 ක් පවත්වා ඇති අතර ඒ සඳහා රාජ්‍ය නිලධාරීන් 5,127 දෙනෙකු සම්බන්ධ වී ඇත. තවද විෂය අවශ්‍යතාවය අනුව වෙනත් රාජ්‍ය ආයතන මඟින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් 20ක් සඳහා නිලධාරීන් හට සම්බන්ධ වීමට අවස්ථාව සලසා දී ඇති අතර, විවිධ රාජ්‍ය ආයතයන්හි විශ්‍රාම වැටුප් සම්බන්ධ පුහුණු වැඩසටහන් 22 ක් සඳහා දෙපාර්තමේන්තු

	නිලධාරීන් සම්පත්දායකයින් ලෙස යොදවා ඇත. 2024 වර්ෂය සඳහා ද මේ වන විට දෙපාර්තමේන්තුවේ පුහුණු අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් පුහුණු වැඩසටහන් 27 ක් ඇතුළත් පුහුණු සැලැස්මක් සකස් කර ඇත. 2024 වර්ෂය සඳහා ද මේ වන විට දෙපාර්තමේන්තුවේ පුහුණු අවශ්‍යතාවන්ට ගැලපෙන අයුරින් පුහුණු වැඩසටහන් 27ක් ඇතුලත් පුහුණු සැලැස්මක් සකස් කර ඇත

එස්. ආලෝකඛණ්ඩාර

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය